**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 2015**

**----------------------------------------**

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව, ඉඩම් සහ ගොඩනැගිලි එකට පවරාගනු ලැබුවත්, ඉඩම් සහ ගොඩනැගිලි වෙන වෙනම ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 1996 වර්ෂයේදී මිලදී ගත් රු.6,648,453 ක් වටිනා ගල්කිස්සේ පිහිටි විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථාන ඉඩම හා ගොඩනැගිල්ලේ වටිනාකම වෙන වෙනම නොපෙන්වා ගොඩනැගිලි ගිණුම යටතේ අඛණ්ඩව පෙන්වා තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) බාහිර උපාධි සහ වෘත්තීය ඉගැන්වීමේ ඒකක මධ්‍යස්ථානය, පශ්චාත් උපාධි ඒකකය සහ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) වැඩසටහන් ඒකකය යන අංශ විසින් බාහිර උපාධි සහ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් පවත්වා සමාලෝචිත වර්ෂය තුලදී රු.18,416,145 ක ශුද්ධ ආදායමක් උපයා තිබුණි. කෙසේ වෙතත්, මෙම ඒකකවල ගනුදෙනු විශ්වවිද්‍යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර නොතිබුණි.

(ආ) බැඳුම්කර කඩකිරීම හේතුකොට ගෙන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු එකතුව රු.1,110,683 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රු.6,648,453 ක් වටිනා අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථානය, නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී කඩා දමන ලදී. කෙසේ වෙතත්, ගොඩනැගිල්ලේ වටිනාකම හා ඊට අදාළ සමුච්චිත ක්ෂය ගිණුම් පොත්වලින් කපා හැර නොතිබුණි.

#### 2.2.3 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කෙරේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය X පරිච්ඡේදයේ 20.6 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුලදී අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් දින 04 සිට දින 113 දක්වා වූ කාල පරාසයන් ඇතුළත දින 332 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, එකී වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර ආකෘති අංක 96 මඟින් විගණකාධිපතිට මාස්පතා වාර්තා කොට නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | අංක 102-104 | විශ්වවිද්‍යාලය සතු මෝටර් රථ 7 ක් අනතුරුවලට ලක්වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුලදී ඒවාට දැරූ අළුත්වැඩියා පිරිවැය රු.199,075 විය. කෙසේ වෙතත්, සිදු වූ හානියේ ප්‍රමාණය හා හානියට හේතු ලබාගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ පිළිබඳ වගකීමද නිශ්චය කර පවරා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396 | විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද රු.484,473 ක් වටිනා චෙක්පත් 104 ක් වසර 2 සිට 9 අතර කාලයක් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, මුදල් රෙගුලාසිවල විධිවිධාන පරිදි කටයුතු නොකර එකී සියලුම ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම වගකීම් ලෙස පෙන්වා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | එකතුව රු.1,539,815 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 62 ක් වසර 2 සිට වසර 12 ක කාල පරාසයක් තුල නිරවුල් නොවී පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.170,608,906 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය රු.101,928,821 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.68,680,085 ක පිරිහීමක් පිළිබිඹු විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පුද්ගල පඩිනඩි රු.176,272,418 කින් වැඩි වීමයි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

විශ්වවිද්‍යාලයේ සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්යසාධනය පහත පරිදි වේ.

**(අ) උපාධි පාඨමාලා පැවැත්වීම**

එක් එක් පීඨයන් සඳහා ඉකුත් වර්ෂ තුනකදී බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව පහත දැක්වේ.

| පීඨය | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2015 | 2014 | 2013 |
| ව්‍යවහාරික විද්‍යා | 329 | 244 | 243 |
| කලා හා සංස්කෘතිය | 239 | 246 | 418 |
| කළමනාකරණ හා වාණිජ | 370 | 396 | 376 |
| ඉස්ලාම් හා අරාබි භාෂාව | 362 | 340 | 231 |
| ඉංජිනේරු | 101 | 114 | 102 |
| එකතුව | 1,401 | 1,340 | 1,370 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

2013 වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී ව්‍යවහාරික විද්‍යා සහ ඉස්ලාම් සහ අරාබි භාෂා යන පීඨ සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් සියයට 35 කින් සහ 57 කින් වැඩි වී තිබූ අතර 2013 වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී කලා සහ සංස්කෘතික පීඨය සඳහා බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 43 කින් අඩු වී තිබුණි.

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ තුනකදී විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.000) | 397,507 | 300,144 | 236,707 | 153,310 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 3,684 | 3,227 | 2,845 | 2,034 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු.000) | 108 | 93 | 83 | 75 |

2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ ඒක ශිෂ්‍ය පිරිවැය එක් එක් වර්ෂයේ සියයට 13 කින් වැඩි වී තිබුණි.

**(ඇ) පර්යේෂණ දීමනා ගෙවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2011 අප්‍රේල් 20 දිනැති අංක 01/2011 දරණ උසස් අධ්‍යාපන චක්‍රලේඛය සහ 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව පර්යේෂණ කමිටුවේ අනුමැතිය සහිතව, පර්යේෂණ යෝජනාව ඉදිරිපත් නොකළ අධ්‍යයන කාර්ය මණ්ඩලයට පර්යේෂණ දීමනා ලබා ගැනීමට හිමිකමක් නැත. කෙසේ වෙතත්, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තිදෙනෙකු පර්යේෂණ කමිටුවේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු.501,002 ක පර්යේෂණ දීමනා ලබාගෙන තිබුණි.

(ii) 2014 වර්ෂයේදී ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන් 2014 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද සහ පර්යේෂණ කමිටුව විසින් අනුමත කරන ලද පර්යේෂණ 7 කට අදාළ පර්යේෂණ වැඩ, 2014 වර්ෂයේ අවසානයට නිම කළ යුතුව තිබුණි.

කෙසේ වෙතත්, එකී පර්යේෂණ වැඩ 2016 මැයි 13 වන දින වන විටත් නිමකර නොතිබුණි. මේ සඳහා එකී කථිකාචාර්යවරුන්ට විශ්ව විද්‍යාලය විසින් එකතුව රු.190,000 ක් ගෙවා තිබුණි.

(iii) 2013 වර්ෂයේදී අත්තිකාරම් මුදල පියවන බවට අදාළ කථිකාචාර්යවරයා කරන ලද ඉල්ලීම පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව විසින් පිළිගෙන තිබුණු නමුත්, 2011 වර්ෂයේදී කථිකාචාර්යවරයකුට පර්යේෂණ වැඩ කිරීම සඳහා ගෙවා තිබූ රු.22,500 ක පර්යේෂණ අත්තිකාරම් මුදල 2016 ජුනි 13 දින වන විටද පියවා නොතිබුණි.

**(ඈ) අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු අනුමත කිරීම**

---------------------------------------------------

විශ්ව විද්‍යාලය විසින් ජොෂ්ඨ කථිකාචාර්යවරයකුට 2006 සිට 2010 කාලපරිච්ඡේදය තුලදී මාස 39 ක වැටුප් සහිත නිවාඩු සහ දින 298 ක වැටුප් රහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණු අතර ඒ සඳහා මැලේසියාවේ කෙබනිසන් (Kebangsan University) විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි වැඩසටහන වෙනුවෙන් උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය යටතේ (NCAS) රු.2,179,410 ක මූල්‍ය ආධාරයක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, වසර 5 ක් ගත වී ඇතත් කථිකාචාර්යවරයා විසින් ආචාර්ය උපාධි වැඩසටහන නිමකර නොතිබුණි.

**(ඉ) බාහිර කථිකාචාර්යවරුන්ගේ කාර්යසාධනය**

---------------------------------------------------

විශ්ව විද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී ඉංජිනේරු පීඨයේ දේශන පැවැත්වීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් 42 දෙනෙකු පත්කර තිබූ අතර එක් එක් විෂයයට වෙන්කර ඇති කාලසීමාව ඇතුළත විෂය නිර්දේශය සම්පූර්ණ කරදෙන ලෙස ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, එක් එක් විෂයයට වෙන්කර තිබූ දේශන පැය ගණනින්, පැය 10 සිට පැය 22 අතර පරාසයක් දේශන පැය සම්පූර්ණ කර නොතිබුණි. ඒ හේතුවෙන් එකී බාහිර දේශකයන් විසින් විෂය නිර්දේශය සම්පූර්ණයෙන්ම නිම කළේද, යන්න ප්‍රශ්නකාරී විය. විස්තර පහත දැක්වේ.

| විෂයය | වෙන්කළ මුළු පැය ගණන | නිමකළ මුළු පැය ගණන | සම්පූර්ණ නොකළ දේශන පැය ගණන |
|---|---|---|---|
| ---------- | ------------------- | ---------------- | ---------------- |
| ද්‍රව විද්‍යාව (Fluid Mechanics) | 38 | 28 | 10 |
| ද්‍රව්‍ය විද්‍යාව (Mechanics of Materials) | 38 | 28 | 10 |
| නිෂ්පාදන ඉංජිනේරු ශිල්පය | 30 | 18 | 12 |
| දත්ත ව්‍යුහ (Data Structure) | 30 | 12 | 18 |
| මහාමාර්ග, ප්‍රවාහන සහ ඉංජිනේරු ශිල්පය | 37 | 26 | 11 |
| විදුලි හා විදුලි සන්දේශ | 30 | 08 | 22 |

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) වයිට්බෝඩ් මිලදී ගැනීම**

------------------------------

විශ්ව විද්‍යාලය 2014 සහ 2015 වර්ෂවලද එකක් රු.14,720 බැගින් රු.132,480 ක් වටිනා වයිට් බෝඩ් 9 ක් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තියේ සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර මිලදී ගෙන තිබුණි. නව පීඨ ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවයට පෙර මෙකී වයිට් බෝඩ් සැපයීම හදිසි අවශ්‍යතාවයක් වූ බව මේ සම්බන්ධයෙන් උපකුලපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ii) මෙම වර්ෂයේම වයිට් බෝඩ් විශ්ව විද්‍යාලයට සැපයූ එම සැපයුම්කරුගෙන්ම විගණන කටයුතු සඳහා ලබාගත් මිල ගණන් අනුව, එම වර්ගයේම වයිට් බෝඩ් එකක් රු.5,120 බැගින් සැපයීමට එකඟ විය. ඒ අනුව රු.86,400 ක් සැපයුම්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(iii) මෙම කරුණ විශ්ව විද්‍යාලයට වාර්තා කළ නමුත්, මුදල් රෙගුලාසි 128 (1) (ඕ) පරිදි මෙම වංචනික ස්වභාවයේ ගනුදෙනුවට වගකිව යුතු නිලධාරියාට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ආ) භාෂා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම**

---------------------------------------

රු.මිලියන 8.1 ක් වැය කොට කලා සහ සංස්කෘති පීඨයේ ස්ථාපිත කර ඇති භාෂා විද්‍යාගාරය වසර 6 කට වැඩි කාලයක් තිස්සේ අදාළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. රු.මිලියන 4.1 ක් වටිනා Multimedia පරිගණක (PCS), සිසුන් සඳහා කුඩාරම් වැනි උපකරණ 2007 සහ 2009 වර්ෂවලදී මිලදීගෙන මේ වනවිට යල්පැනගොස් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. එබැවින් මෙම විද්‍යාගාරය ස්ථාපිත කිරීමට, වැය වූ සම්පූර්ණ මුදලම නිශ්ඵල වියදමක් වී තිබුණි

**(ඇ) පරිගණක විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම**

----------------------------------------------

බාහිර උපාධි සහ වෘත්තීය ඉගැන්වීමේ මධ්‍යස්ථානයේ රු.මිලියන 2.82 ක් වැය කොට 2013 වර්ෂයේදී ස්ථාපනය කරන ලද පරිගණක විද්‍යාගාරයක්, 2016 ජූනි 13 වන විටත් අපේක්ෂා කළ කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි.

**(ඈ) ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදීගැනීම**

--------------------------------------------

ඉස්ලාම් අධ්‍යයන හා අරාබි භාෂා පීඨයේ පීඨාධිපතිගේ ඉල්ලීම පරිදි ශිෂ්‍යයන් හා කථිකාචාර්යවරුන්ගේ පැමිණීම සටහන් කිරීම සඳහා මුළු පිරිවැය රු.616,000 ක් දරමින් විශ්ව විද්‍යාලය විසින් ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර 10 ක් 2014 දෙසැම්බර් 10 දින මිලදී ගෙන සවිකර තිබුණි. කෙසේ වෙතත්, එකී යන්ත්‍ර 2016 ජූනි 15 දින වන විටත් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි.

**4.3 කළමනාකරණ දුර්වලතා**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවය අතහැර ගිය අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් දෙදෙනෙකු හා අනධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් තුන්දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.665,570 ක ණය ශේෂ වසර 04 සිට වසර 16 දක්වා කාලපරිච්ඡේදයක් තුළ අයනොවී පැවතුණි. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලය විසින් කිසිදු වලංගු සුරකුම් මෙම ණය මුදල වෙනුවෙන් ලබා නොගෙන ණය

ප්‍රදානය කිරීම හේතුකොට ගෙන මෙම හිඟ මුදල් අයකරගැනීමට විශ්ව විද්‍යාලයට හැකියාවක් නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ X වැනි පරිච්ඡේදයේ 23 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඉතිරි කරගත් නිවාඩු, නිවාඩු ලේඛනයෙහි සටහන් කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත්කරුවන්ට කළ රු.8,054,468 ක ගෙවීම් මත, සියයට 11 බැගින් ගණනය කළ යුතු එකතු කළ අගය මත බදු (VAT) වෙනුවට සියයට 12 රේට් මත රු.1,398,693 ක එකතු කළ අගය මත බදු ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.116,557 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි. එකී වැඩිපුර ගෙවූ මුදල 2016 ජුනි 13 දින වන විටත් ආපසු අයකරගෙන නොතිබුණි.

**(ඈ) අත්තිකාරම් ගෙවීම්**

විශ්වවිද්‍යාලය සමාලෝචිත වර්ෂය තුළදී එහි කාර්ය මණ්ඩලයට එකතුව රු.1,243,600 ක අත්තිකාරම් අවස්ථා 25 කදී ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තිකාරම් මුදලක් ලබාදීමෙන් පසු ඊට අදාළ කාර්යය නිම වූ වහාම පියවිය යුතු නමුත් ඉහත කී අත්තිකාරම් දින 7 සිට දින 84 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි.

(ii) කාර්ය මණ්ඩලය විසින් කුමන මුදලක් අත්තිකාරම් වශයෙන් ඉල්ලා සිටියත්, ඉල්ලුම් කරන ලද මුදලේ ස්වභාවය සහ සාධාරණ බව සැලකිල්ලට නොගෙන විශ්ව විද්‍යාලය විසින් අත්තිකාරම් ප්‍රදානය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් අවස්ථා 05 කදී ගෙවන ලද එකතුව රු.157,000 ක අත්තිකාරම් සම්පූර්ණ මුදලද, අවස්ථා 20 කදී ගෙවන ලද එකතුව රු.1,086,000 ක අත්තිකාරම් වලින් සියයට 50 ක මුදලක්ද මුදලින් ආපසු පියවා තිබුණි. මෙමඟින් මහජන අරමුදල් අවභාවිතයට ඉඩකඩ සැලසේ.

**(ඉ) විභාග ශාලාව නවීකරණය කිරීම**

ආරම්භයේදී පුස්තකාල ගොඩනැගිල්ලක් ලෙස ඉදිකරන ලද ශාලාවක් 2007 වර්ෂයේදී විභාග ශාලාවක් ලෙස නවීකරණය කරන ලද අතර 2014 සහ 2015 වර්ෂවලදී රු.මිලියන 15 ක් වැය කරමින් යළි උපාධි ප්‍රදානෝත්සවය සහ විභාග පැවැත්වීමේ කාර්යයන් සඳහා නවීකරණය කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙකී නවීකරණ වැඩ සඳහා සැලකිය යුතු මහජන මුදල් ප්‍රමාණයක් වැය කිරීමට සිදු වුවත් නවීකරණ වැඩවලට පෙර විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

(ii) විභාග ශාලාව ගඟට ඉතා ආසන්නව පිහිටා ඇති නිසා වර්ෂා කාලයට මෙම ප්‍රදේශය ගංවතුරට භාජනය වීමේ හැකියාව පවතී. තවද, මෙම ස්ථානය 2011 සහ 2014 වර්ෂ වලදී අඩි තුනක් පමණ ගංවතුරෙන් යටවුණු බව වාර්තා වී තිබුණි. කෙසේ වෙතත්, නවීකරණ වැඩ ආරම්භ කිරීමට පෙර මෙම කරුණු සැලකිල්ලට ගෙන නොතිබුණි.

(iii) මෙම ශාලාව උපාධි ප්‍රදානෝත්සව හා විභාග පැවැත්වීම සඳහා නවීකරණය කරනු ලැබුවත් වාතාශ්‍රය නොලැබීම හේතුවෙන් එම කාර්යයන් දෙක සඳහාම මෙය භාවිතා කළ නොහැකි වී තිබුණි.

(iv) අපේක්ෂිත කාර්යයන් සඳහා භාවිතා කළ නොහැකි වූ බැවින් මෙම ශාලාව 2016 ජූනි 15 දින දක්වාම නිශ්කාර්යව පැවතුණි. එබැවින්, නවීකරණය වෙනුවෙන් දරණ ලද රු.මිලියන 15 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී ඇත.

(ඊ) කථිකාචාර්යවරයකු ගිවිසුම් කඩකිරීම හේතු කොට ගෙන බැඳුම්කර වටිනාකම ලෙස 2015 වර්ෂය වනවිට රු.මිලියන 1.70 ක් අයකර ගත යුතුව තිබුණි. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලය විසින් මෙම මුදල අයකර ගැනීමට ක්‍රියාකර ඇත්තේ වසර 9 ක ප්‍රමාදයකින් පසු 2013 වර්ෂයේදීය. එබැවින් අදාළ කථිකාචාර්යවරයා බැඳුම්කර වටිනාකම අයකරගැනීමට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරන ලදී. මොහු දිවයිනට ආපසු පැමිණ වසර 6 කට අධික කාලයක් විශ්ව විද්‍යාලය විසින් මුදල් අයකර ගැනීමට ක්‍රියා කිරීම ප්‍රමාද කර ඇති නිසා අදාළ කථිකාචාර්යවරයාගෙන් යම් මුදලක් අයකරගෙන ඇතොත් එය ආපසු ඔහුට ගෙවන ලෙසට නඩු තීන්දුව දෙන ලදී. අදාළ කථිකාචාර්යවරයාට ලිපියක් නිකුත් කිරීම ප්‍රමාද කිරීමට වගකිව යුතු නිලධාරියාගේ නොසැලකිල්ල හේතු කොටගෙන විශ්ව විද්‍යාලයට රු.මිලියන 1.73 ක පාඩුවක් සිදු වූ නමුත් 2016 ජූනි 13 දක්වාම එකී නිලධාරියාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(උ) 2013 වර්ෂයේදී පවත්වන ලද සමීක්ෂණ මණ්ඩලය මුළු පිරිවැය රු.මිලියන 37 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 2477 ක ඌනතාවක් අනාවරණය කරගන්නා ලදී. කෙසේ වෙතත්, ඌනතාවන්ට හේතු සහ වගකීම් පැවරීම සඳහා විමර්ශන පැවැත්වීමට කටයුතු නොකර එකී ස්ථාවර වත්කම් විෂයයන්වල පිරිවැය ගිණුම් පොත්වලින් කපාහැර තිබුණි. මෙම කරුණ 2014 වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවෙන් පෙන්වා දී තිබූ නමුත් විශ්ව විද්‍යාලය විසින් 2016 ජූනි 13 දින වනතුරු මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**(ඌ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා අවිධිමත් පත්කිරීම්**

1997 නොවැම්බර් 21 දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 721 දරණ චක්‍රලේඛයට අනුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු සඳහා පත්කිරීම් විවෘත පුවත්පත් දැන්වීම් හරහා සිදු කළ යුතුය. කෙසේ වෙතත්, තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුරුවල රාජකාරී ඉටුකළ නිලධාරීන් 9 දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ලෙස උසස් කර තිබුණි.

**(එ) ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා මෙට්ට මිලදීගැනීම**

2014 වර්ෂයේදී විශ්ව විද්‍යාලය විසින් මුළු පිරිවැය රු.මිලියන 3.14 ක් වූ මෙට්ට 800 ක ගුණාත්මක තත්ත්වය සහ මිල සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු මාගේ 2014 වර්ෂයේ වාර්තාවෙන් පෙන්වා දී තිබුණි. ඒ අනුව, මෙකී මෙට්ටවල ගුණාත්මක තත්ත්වය සනාථ කර ගැනීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයෙන් 2015 සැප්තැම්බර් 25 දින පරීක්ෂණ වාර්තාවක් ලබාගන්නා ලදී. එකී වාර්තාවට අනුව එම මෙට්ටවල තත්ත්වය ප්‍රමිත අවශ්‍යතාවලට අනුකූල නොවන බවට තහවුරු කරන ලදී. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලය විසින් මෙම අවිධිමත් ප්‍රසම්පාදනයට වගකිවයුතු නිලධාරියාට එරෙහිව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම කරුණ අදාළ සැපයුම්කරුට වාර්තා කරන ලද බවත්, හානියට පත්වූ මෙට්ට ප්‍රතිසම්පාදනය කිරීමට හෝ හැකි ඉක්මණින් නිවැරදි කරන ලෙසත් දන්වා යැවූ බවත් ඔහුගේ ප්‍රතිචාර බලාපොරොත්තුව සිටින බවත් ඉන් අනතුරුව ඊළඟ පියවර වශයෙන් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කරන බවත් උපකුලපතිවරයා මා වෙත දන්වා ඇත.

**4.4 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) කළමනාකරණ දිනපොත් මුද්‍රණය කිරීම**

විශ්ව විද්‍යාලය විසින් 2014 වර්ෂය දක්වා සෑම වර්ෂයකම දින පොත් 800 ක් මුද්‍රණය කළ නමුත් සමාලෝචිත වර්ෂය තුලදී තථ්‍ය අවශ්‍යතාව හඳුනා ගැනීමකින් තොරව රු.මිලියන 1.9 ක් වැය කර කළමනාකාරීත්ව දිනපොත් 2,000 ක් මුද්‍රණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.මිලියන 1.2 ක් වටිනා දින පොත් 1,232 ක් විශ්ව විද්‍යාලයට සෘජු බලපෑමක් නැති පුද්ගලයන්ට නිකුත් කිරීමට විශ්ව විද්‍යාලයට සිදු වී තිබුණු අතර රු.44,650 ක් වටිනා දිනපොත් 47 ක් 2016 ජූනි 15 දින වන විටද නිශ්ක්‍රීයව ගබඩාවේ තිබුණි.

**(ආ) ප්‍රධාන සැලැස්ම පිළියෙල කිරීම**

විශ්ව විද්‍යාලය විසින් 2007 වර්ෂයේදී විශ්ව විද්‍යාලය දියුණු කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් (Master Plan) පිළියෙල කිරීමට රු.මිලියන 16.8 ක් උපදේශන ගාස්තු වශයෙන් එක්සත් රාජධානිය පාදක කරගත් ඉංජිනේරු උපදේශක සංවිධායකට ගෙවා තිබුණි. අනතුරුව, මෙකී සැලැස්ම අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතු කොට ගෙන ණය දෙන නියෝජිතායතනය විසින් ප්‍රතික්ෂේප කළ නිසා විශ්ව විද්‍යාලය විසින් නව ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම වෙනත් උපදේශක සමාගමකට 2010 වර්ෂයේදී රු.මිලියන 7.2 ක් ගෙවා තිබුණි. මේ හේතුවෙන් එක්සත් රාජධානිය පාදක සමාගමට ගෙවන ලද රු.මිලියන 16.8 ක මුදල නිශ්ඵල වියදමක් බවට පත් වී තිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනය

### 4.5.1 ව්‍යවහාරික විද්‍යා පීඨයේ ශිෂ්‍ය නේවාසිකාගාරයක් සහ නිල නිවාස ඉදිකිරීම

ශිෂ්‍ය නේවාසිකාගාරයක් සහ කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම සඳහා විශ්ව විද්‍යාලය රු.මිලියන 92.51 ක වටිනාකමට කොන්ත්‍රාත්තුවක් 2011 නොවැම්බර් 01 දින ප්‍රදානය කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව ඉදිකිරීම් වැඩ 2012 දෙසැම්බර් 17 දිනට පෙර නිම කළ යුතු වුවද, 2016 ජූනි 15 දින වන විට සියයට 80 ක ඉදිකිරීම් වැඩ පමණක් නිමකර තිබුණි. කෙසේ වෙතත්, මිල ඉහළ යාම් ලෙස විශ්ව විද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරුට රු.මිලියන 7.09 ක අතිරේක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, මූලික කොන්ත්‍රාත් මිලෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 0.05 බැගින් දිනකට ප්‍රමාද වන්දි අයකර ගත යුතුය. කෙසේ වෙතත්, රු.මිලියන 9.25 ක් වූ ප්‍රමාද වන්දි කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට විශ්ව විද්‍යාලය කටයුතු නොකළ නමුත් කොන්ත්‍රාත්කරුට ගෙවීම් ප්‍රමාද වීම් මත රු.මිලියන 1.21 ක් දඩ වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුගේ ඉතා දුර්වල කාර්යසාධනය හේතුවෙන් නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම වසර 3 කට අධික කාලයක් ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵල ලෙස 2013 සිට 2015 වර්ෂය දක්වා විශ්ව විද්‍යාල සිසුන්ට නේවාසික පහසුකම් සපයාදීම සඳහා කුලියට ගත් ගොඩනැගිලි වෙනුවෙන් කුලී වශයෙන් රු.මිලියන 8.69 ක් ගෙවීමට විශ්ව විද්‍යාලයට සිදු වී තිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍යාධිකාරී තනතුර 2013 දෙසැම්බර් 15 දින සිට පුරප්පාඩුව පැවතුණි. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලය මේ දක්වා මූල්‍යාධිකාරී තනතුරට සුදුසුකම්ලත් නිලධාරියෙකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහාචාර්ය සහ සහාය මහාචාර්ය තනතුරු වසර කීපයක සිට පුරප්පාඩුව පවතී. මෙම තත්ත්වය ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතුවලට බරපතල ලෙස බලපා තිබුණද විශ්ව විද්‍යාලය ඒ සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

**5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

---

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---

සමාලෝචිත වර්ෂය සඳහා විශ්ව විද්‍යාලය ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරණ අය ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2015 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලය ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 වාර්ෂික සමීක්ෂණ පැවැත්වීම**

---

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරණ ආයතන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කොට සමීක්ෂණ පවත්වා එහි වාර්තා 2016 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2016 ජුනි 13 වන විටත් 2015 වර්ෂය සඳහා සමීක්ෂණ පවත්වා නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | - | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | - | ප්‍රමාද වන්දි අයකර ගැනීම, දීර්ඝ කිරීම් සඳහා අනුමැතිය ලබාගැනීම, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල වීම. |